# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1482 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 18/09/2024 පැය 1330

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01.** **2024.09.17 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 04 | 520 | තඹ දඟර 01<br>ප්ලාස්ටික් බූලි 02<br>යකඩ බැරල් 04 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර**

2024.09.17 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වනාතවිල්ලුව පොලිස් වසමේ තබ්බෝව රක්ෂිතයේ රාල්මඩුව ප්‍රදේශයේ වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව මෙරට නිශ්පාදිත බෝර 12 ගිනි අවියක් පතරොම් හා මුව මස් සන්තකයේ තබාගත් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වනාතවිල්ලුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 40 **ක් වූ එළුවන්කුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වනාතවිල්ලුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිළිනොච්චිය කඳවුර**

2024.09.17 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුවරසන්කුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කිළිනොච්චිය පොලිස් වසමේ මරදනගර් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ටිපර් රථයක් සමඟ අත්අඩංගුවට ගෙන කිළිනොච්චිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ මඩු ප්‍රදේශයේ පදිංචිකාරුවෙක් වේ.** කිළිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. පර්චස් 10 ක පමණ භූමියක වගා කර තිබූ ගංජා පැල සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර**

2024.09.17 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තණමල්විල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තණමල්විල පොලිස් වසමේ සූර්යආර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර පර්චස් 10 ක පමණ භූමියක වගාකරන ලද අඩි 05 ½ ක් පමණ උස ගංජා පැල 3570 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වූ සූර්යආර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**